සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු**

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**සිංහල I**

**Sinhala I**

71 S I

පැය 03 විනාඩි 10

**Time: 03 hour & 10 min.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

(1) පළමුවැනි ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න. )

(අ) '' ...... මට්ටකුණ්ඩලී ඒ අසා 'මාගේ රථමැදිරියෙක් ඇත. ඒ තෙමේත් ගනරන්මුවා ය. ඊට නිසි වූ සක්සගලක් නො ලැබෙමි. ලදොත් ජීවත්වන්නාක් මුත් නොලදොත් ජීවිතය හරිමි' කියා ශෝක හරවන්ට කාරණ වූ ශෝකකාරණය කීහ. ඒ අසා බමුණාණෝ පුතණුවන් මියයාම ත්‍යාග උදහස බලවත් වූවා සේ 'ළදරුවාණෙනි, තොපි ඉල්වන සක්සගල මාගේ සම්පත් බෝහෝ ව ඇති බැවින් රත්රනින් වුවත් රිදියෙන් වුවත් මුතුමැණික් ආදියෙන් වුවත් තොප කියාලූ තරමෙක කරවා දෙමි. වුවමනා තරමක් කියව' යි බත් පමණකින් හා යම්තම් මිලයකින් කරවා දීලිය නො හී කුණ්ඩලාභරණය තුමූ ම කොට දුන් තැනැත්තෝ 'සත්රුවනින් සක්සගලක් කරවා දෙමි'යි කිවූ ය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව්පුත් 'මේ තමාගේ පුතුට බෙහෙත් පමණක් වුවමනා ලෙස නො කරවා පැන් වත්කළ මනා ගසට හුණුපැන් වත්කරන්නා සේ නොබෙහෙද් බෙහෙත් කොට මරා තබලා දැන් පුතණුවන් සැටියේ ආ මා කී දෙයක් කරවා දෙමී කියයි. තරයේ ම මූ චකිත කරවා ලමි. කෙසා විතර සක්සගලක් කරවා දෙවු දැ යි විචාළහ. ' තොප කී විතරකැ' කී කල්හි 'මාගේ රථමැදිරිය ගනරන්මුවා ය. එසේ හෙයින් ඊට තරම් වතොත් හිර හා සඳ ය. ඒ දෙක සම්හ වී නම් ගමන් බලාලූ කලට ජවනහංස ජාතකයෙහි හංසරාජ ව උපන් බෝසතුන් කිසිවිටෙක පසුබටත් සෙස්සවුන්ට පසුබැස්මක් නැති හෙයින් ඉතා බලවත . එසේ හෙයින් හිර හා සඳ සම්හ වී නම් ඒ මාගේ රථය හොබ්බී, සෙසු සක්වලින් ප්‍රයෝජන නැතැ'යි කිව. බමුණු ඒ අසා ළදරුව, තෝ ඉතා ම නුවණ නැත්තේ ය. ''

(i) අදින්න පුබ්බක බමුණාගේ ශෝකය නැති කිරීමට මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා යෙදූ උපක්‍රමය කුමක් ද?

(ii) ඡේදයට අනුව අදින්න පුබ්බක බමුණා උපහාසයට ලක් වන අවස්ථාව කුමක් ද?

(iii) ''පැන් වත්කළ මනා ගසට හුණුපැන් වත්කරන්නා සේ නොබෙහෙත් බෙහෙත් කොට මරා තබලා'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න

(iv) ගන රන් මුවා යන්නට කෙටි විවරණ සපයන්න (ලකුණු 1x 4 = 04 යි)

(ආ) එබසට අනුරුද්ධ කුමාරයෝ 'යහළු, ජරාමරණදෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙක් නැත. සමහර කලෙක ජරාව පළමුව යෙයි. සමහර කලෙක ජරාවට මරණ පළමුව යෙයි. තෙලෙ නුවණෙක් නොවෙයි. අප බුදුහු එකුන්තිස් ඇවිරිද්දෙහි කාමසුව හැර සත්දවසකින් ලැබෙන සක්විතිරජය හැර මහණ වූහ. උදායින් ආදි වූ මෙම නුවර මහඇමතියෝ ද නව යෞවනයෙහි මහණව අමාමහනිවන් දැක දැන් අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙන් ඇවිදිති අපි ඔවුන් වඳුම්හ ; පුදම්හ; සත්කාර කරම්හ; මෙයිදු ලජ්ජාවකට ඇත. කාමසුව විදීම නම් නුවණැසින් බැලූ කල සුව විඳීමක් නොවෙයි; දුක් විඳීමෙක; එකලාව වලට ගොස් තපස් කිරිම නම් විශේෂයෙන් බැලූ කල දුක් විඳීමෙක් නොවෙයි; ඒකාන්ත සුව විඳීමෙක, යහළු, දෙබසක් නොකියව; මහණ වන්නට යම්හ''යි කීහ.

(i) ඡේදයට අනුව ජීවිතයේ යථාර්ථය කුමක් ද?

(ii) ජීවිතයේ ඇති එක ම සැපත කුමක් ද?

(iii) ''අමාමහනිවන් දැක දැන් අප ඉස පියපස් වගුරුවාගෙන ආකාශයෙන් ඇවිදිති'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) 'කාම සුව' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1x 4=04 යි)

(ඉ) ' මේ කිම් දැ' යි බුදුන්ගේ තරම නොදැන නොහදහන්ට වන්හ. උන් හැම දෙනාගේ නොහැදිහිල්ල හරවන නිසාත් දෙස් කීවවුන්ට දෙන අත්ලසක් සේ උන්ට ලොවුතුරා සම්පත් දෙවනු නිසාත් ' මට්ටකුණ්ඩලී දෙව්පුත් තමාගේ දිව්‍යසැපතින් පිරුණු මාළිගාව හා සමඟ එව'යි සිතා වදාළ සේක. බුදුන් එසේ සිතා වදාළ සිතිවිල්ල හා සමඟ ම දෙව්බරණින් සැරහුණා වූ තුන්ගවු පමණ අත්බැවින් අවුත් විමනින් බැසපියා බුදුන් වැඳ එකත්පස් ව සිටියේ ය. බුදුහු දෙස් කියවන්නා සේ ඔහු ලවා කියවා ඔහු ලත් සම්පතත් පෑ සැක හරවනු පිණිස 'දේවතාවා කුමන පින්කමක් කොට මේ දිව්‍යසැපත් ලද්දි දැ'යි විචාළ සේක. දේවතාවා ද 'අනික් පින්කමක් නො දනිමි. නුඹ වහන්සේ කෙරෙහි සිත පහදවා ගත් පින්කම්(න). එයිත් ලඝු පින්කමක් නොවන හෙයින් මේ සම්පත් ලදිමි' බොහෝ දෙනාට අස්වා කිවූ ය. බොහෝ දෙනා දිව්‍ය පුත්‍රයාත් ඔහුගේ සම්පතත් දැක 'අනේ බුදුන්ගේ පින්කෙත් ලෙසක් ඉතා විස්මය නියා ය. අනික් පින්කමක් නොකළ මට්ටකුණ්ඩලියා පවා බුදුන් කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් මේ සා සම්පතක් ලැබපී ල'යි සතුටු ව පින්කම් කිරීමෙහි උත්සාහ ඇති වූහ. බුදුහු යම් සේ රජ්ජුරු කෙනෙක් මහසම්පත් යමෙකුට දෙන කල තමන්ගේ ත්‍යාගිකම දක්වනු නිසා සම්පත් වට්ටෝරුවක් කරවාලා දෙන සම්පත් මෙතෙකැයි වට්ටෝරු ලියවාලා කියවාලා දෙත් ද එපරිද්දෙන් එතනට පැමිණි පර්ෂදටත් බමුණාණන්ටත් දේවතාවාණන්ටත් නිවන් සම්පත් දෙනු නිසා බණ දෙසන සේක්''

(i) මට්ටකුණ්ඩලී දිව්‍ය සම්පත් ලැබීමට කළ පින්කම කුමක් ද?

(ii) බුදුන් වහන්සේ කළ අධිෂ්ඨානය කුමක් ද?

(iii) "දෙස් කියවන්නා සේ ඔහු ලවා කියවා ඔහු ලත් සම්පතක් පෑ සැක හරවනු පිණිස'' යන උද්ධෘත ය ලිහිල් බසින් ලියන්න.

(iv) " දෙස් කිවවුන්ට'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1x 4 = 04 යි)

(ඊ) මෙසේ මෙසේ නොයෙක් ප්‍රකාරයෙන් එක කුඹුරෙහි වී වියදම් කොට ඉතිරි දෙයක් ගෙනවුත් කොටුවෙක පටවාගෙන බිජුවට යයි එක් භාගයක් තබාගතමැනව; ඇස් යයි එක් භාගයක් වෙන් කොට බිජුවටභාගය නොකා ඇස්භාගය කැවමැනව. එසේ කන කල පමණ නොදැන නොකා අදට මෙතෙක් ගතමැනව. සෙටට මෙතෙක් ගත මැනවැයි පමණ දැන කැවමැනව. මතු මෙතෙක් දවස් ගියකල ගොයම් පැසෙයි. එවක දක්වා රැකුණ මනා වේ දැයි සිතසිතා සුඟින්සුඟ කැවමැනව. මෙසේ එක් සමයෙක දුක්ගෙන උපයාගත් කල අනික් සමයෙහිත් පෙර නොකළා සේ ම මෙසේ වීර්ය කළමනාය. මෙසේ දිවිහිමියෙන් ම යලත් මාසත් අප්‍රමාද ව මෙහෙ කළ මැනව. පරික්ෂා කළ කල ගොවීහු නිකම් හිඳිනා දවසෙක් නම් නැත. ලෙඩට හොත් කලත් මෙකී කර්මාන්ත කොට ගත නොහැකි හෙයින් උපයා කෑ නොහැක්ක. සේවා කම් ආදී වූ නොයෙක් කටයුත්තෙහි නියුක්තව ගිට කලක් ගම හිඳ උපයා කෑම නම් නැත්තමය මහලුව ජරාවට පැමිණි කලත් මෙකී කර්මාන්ත කොට ගත නොහැකි හෙයින් උපයා කෑ නොහැක්ක. එකල දැතින් දෙදඬුගෙන විලිපිළියෙන් විරූපව කුදගසාගෙන පෙර තමා උපයා කෑ රටට ම වෙස්බැඳපානා විකාර රූපයක් සේ දොරින්දොර සිඟා කා ඇවිද්දමනා ම ය. එසේ හෙයින් මලණ්ඩ නුවණැසින් බැලුවානට මෙසසර සුව විඳීමෙක් නො වෙයි. දුක් විඳීමෙක් ම ය.

(i) කුඹුරෙන් ලබාගන්නා වී ප්‍රයෝජනයට ගන්නේ කෙසේ ද?

(ii) ජීවිත කාලයම කුඹුරු වැඩ කළ යුතු බව කියැවෙන පාඨය උපුටා ලියන්න.

(iii) ''එකල දැතින් දෙදඬුගෙන විලිපිළියෙන් විරූපව කුදගසාගෙන'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''ඇස් භාගය'' යන්නට කෙටි විවරණ සපයන්න .

(ලකුණු 1x 4 = 04 යි)

(උ) (i) කුමර කෙළි පුරු දුව
ගුරුන් පෙම්කොඳ තරි ඳුව
දිසි පින් පිඬු බ ඳුව
සොඳුරු ගුත්තිල නමින් පසි ඳුව

(ii) සුරඟන උව වෙත ට
අදනා සොඳුරු රුසිර ට
නරඟ රඟ පසු කො ට
පැමිණ සපිරුණු සොළොස් වයස ට

(i) ගුත්තිල පඬිවරයාගේ ළමා කාලය කෙසේ ගතවී ද?

(ii) ගුත්තිල පඬිතුමා සඳක් ම යැයි දැක්වෙන පද්‍ය පාඨය උපුටා ලියන්න.

(iii) ''සුරඟන උව වෙත ට - අදනා සොඳුරු රුසිර ට'' යන උද්ධෘත ය ලිහිල් බසින් ලියන්න.

(iv) 'නරඟ රඟ ' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 1x 4 = 04 යි)

**(ඉ) සහ (ඒ) යන ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.**

(ඉ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) ''මෙතෙක් සම්පත් තබාගෙන හිඳ දුප්පතා සේ පුතුට පිළියම් පමණකුත් නොකරවා නසාපී ය''

(ii) ''මැණියන් වහන්ස මෙතෙක් දා, නුඹ මං නොසනා ඇත්තේ ඇයි?

(iii) ''මෝ හට මෙච්චරෙක් ම සෑහෙ යි''

(iv) ''මගේ මිනිහා ඒක ඇතුළෙ වෙන්ඩ පුළුවනි''

(v) ''මගේ පොල්ලෙලි ටික අද තොටුපළට ගෙනියන්න තියෙනවා''

(vi) ''ඇදුරුතුම කිම් ද මේ ? ඔබතුමා කියන බස්''

(vii) ''ම පුතුණුවන්ට නැතැයි යන බසෙහි අර්ථය උගන්වමි''

(ලකුණු 3 x 4 = 12 යි)

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

සි ත කි න් සිතනු බැරි තරමට තිබෙන අගේ
සැ පති න් වැඩෙන පෙම්බර ලක් මවුනි මගේ
ල බ මි න් පිහිට ඉටු දෙවියන්ගෙනුත් සගේ
ය හ ති න් ඉන්න මල් බර සල් රුකක් වගේ

ස තු වී තිබෙන කොට ඔබගේ සෙනේ දම
මු තු මිණි රනින් මට අත් වන පලේ කිම
පු තු වෙමි ඔබට උපදින හැම තැනේදීම
පැ තු මෙන් මගේ සිරි ලක් මව වඳිමි මම

න හ මක් බලා කිසි විට හොඳ නොහොඳ පැති
ද හ අත ගලන ඔබගේ මහ කුලුණු ගති
ම හ තයි දිගයි ගම්බීරයි කියනු යුති
ම හ වැලි කැලණි කළු ගං ගල ගලා යති

නි ව නේ මිහිර රැඳි බුදු දම් අමා කිරි
පො ව මින් නළව නළවා ගන්වමින් දිරි
ලො ව ඔද වඩන නොකැළැල් පෙම් ගුණෙන් පිරි
ක ව රෙක් ඇද්ද මගේ සිරි ලක් මවට සරි

ක ඳු වන රසට කැඳවා ලොව දසනුදෙස
ඉ ඳු වා වඩා සමනොළ මල් යහන් කුස
උ දු රා සමය කුල නිල බේ නපුරු විස
පු දු මයි ඔබ කවන සැටි සමඟියේ රස

තෙ ව රක් තිලෝගුරු මුනි රජු වැඩම කොට
ල ව මින් අරන් පන්නා යක් සෙනග වට
සු ව දී වදාළේ නම් දුක් බැහැර කොට
නි ව නින් මෙපිට ඔබ වෙහි රැකවරණ මට

| | | | |
|---|---|---|---|
| ද | මි | සෝ නිරිඳු පුත් අරහත් මිහිඳු | හිමි |
| ද | මි | මී පෙවිය සිරිමත් ඔබ ගුණට | නැමී |
| ම | මි | ඔබෙ මුවට මුව තබමින් උරමි | එමී |
| අ | මි | මෙනි එය ම මුළු ලෝකෙට පොවමි | දෙමී |

(ලකුණු 12 යි)

(02) පුද්ගල සන්තානගත දැඩි මසුරුකමත් එය විග්‍රහ කිරිමට සංවාදශීලී බස් වහරක් යොදා ගැනීමට සද්ධර්මරත්නාවලි කතුවරයා සමත් වී ඇත්තේ කෙසේ'දැයි සුදුසු උදාහරණ දක්වමින් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

(03) දෙමව්පියන් දරුවන් සමාජගත කිරිමේදී ළමා වියේ සිට ම ප්‍රායෝගික ජීවිතයට හුරුකළ යුතු යි යන අදහස අනුරුද්ධ කුමාර කතාවෙන් නිරූපණය වෙයි. සුදුසු උදාහරණ දක්වමින් මෙම අදහස විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

(04) සජීවී සැණකෙළියක අසිරිය චමත්කාරජනකව ඉදිරිපත් කිරීමට ගුත්තිල කවියා සමත් වී ඇත්තේ කෙසේ දැ'යි උචිත උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(05) ළමා මනසට හා වැඩිහිටි මනසට උචිත ආකාරයෙන් කාව්‍ය නිර්මාණ කිරීමට කොළඹ යුගයේ ප්‍රථම තරංගයේ කවීන් සමත් වූයේ කෙසේ දැ' යි උචිත පද්‍ය පන්ති තුනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

(06) සිංහල නවකතා කලාවේ සහ කෙටිකතා කලාවේ විකාශනය පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 15 යි)

(07) දුෂ්කර පරිසරයකට අනුගත වූ චරිත නිරූපණයක් කිරීමට බැද්දේගම කතුවරයා සමත් වූයේ කෙසේ දැයි බැද්දේගම නවකතාවේ අදාළ චරිත තුනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Term Test, March 2020**

**සිංහල II**

**Sinhala II**

71 S II

පැය 03 විනාඩි 10

**Time: 03 hour & 10 min.**

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

- 1 කොටසේ 1 ප්‍රශ්නය ද 11 කොටසේ 2 සහ 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලුම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- 1 කොටස, 11 කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

(1) එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. කණ්ඨ ඕෂ්ඨජ අක්ෂර සේ සැලකෙන්නේ කවරක් ද?

(i) ඇ , ඈ , එ , ඒ , ඓ
(ii) උ , ඌ , ප, ඵ , බ, භ , ම
(iii) ඔ , ඕ , ඖ
(iv) ක , ච , ට , ත , ප
(v) ග , ජ , ඩ , ද , බ (............)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(i) සැළසුම, මානුශික, පැලඳීම, තොටමුණ, උත්කෘෂ්ට
(ii) සැලසුම, මානුෂික පැලඳීම, තොටමුණ, උත්කෘෂ්ට
(iii) සැළසුම, මානුෂික, පැළඳීම, තොටමුණ, උත්කෘෂ්ට
(iv) සැලසුම, මානුෂික, පැළඳීම, තොටමුණ, උත්කෘෂ්ඨ
(v) සැලසුම, මානුෂික, පැළඳීම, තොටමුන, උත්කෘෂ්ට (............)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(i) අල්මාරිය, මේසය, පුටුව, පිහිය
(ii) කණ්ණාඩිය, ජෝගුව, බෝතලය, පීරිසිය
(iii) උදැල්ල , කැත්ත , කේතලය, ඇඳ
(iv) කෝප්පය, පලගාන, පිඟාන, වීදුරුව
(v) ඉදල , කොස්ස, පෙනේරය, තාච්චිය (............)

1.4 පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) රේඵය වෙනුවට රකාරාංශය වුව ද භාවිත කළ හැකිය.
(ii) ව්‍යඤ්ජනයකට පරව බැඳෙන ''ර්'' වෙනුවට රකාරාංශය යෙදේ.
(iii) රේඵය මූර්ධජ අක්ෂරයක් සමඟ ම භාවිත කළ යුතුය.
(iv) ස්වරයකට පරව බැඳෙන 'ය' වෙනුවට යංශය යෙදේ.
(v) 'ඥ' යනු සංයුක්ත ව්‍යඤ්ජනයක් නොවේ. (............)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(i) ශිලා ලිපි, සිරි ලංකාව, මහා විදුහල
(ii) විදේශ පුවත් ,දළඳා මන්දිරය, පිය පාර්ශවය
(iii) මව් භූමිය, රන්වන් රශ්මි, දහම් දේශනය
(iv) බෞද්ධ ශාසනය, කීර්ති ඝෝෂාව, වාලුකා කාන්තාරය
(v) ප්‍රථමා විභක්තිය, ශිලා ලේඛනය, ඇමති මණ්ඩලය (............)

1.6 තත්සම වචන පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(i) මංගල්‍ය, වෙහෙර, බෞද්ධ, අපර
(ii) ජය, ආචාර, පරිත්‍රාණ, වාක්‍ය
(iii) කිරණ, සමය, පුර, නල
(iv) ආදර, ගජ, අභිෂේක, කුලපති
(v) අපර, බෞද්ධ, මනහර, බාදනය (............)

1.7 ඔ, ඖ , උ, ඇ ස්වරයන් පිළිවෙළින් පළමු අකුරේ යෙදෙන අන්දමට පිල්ලම් දැක්වෙන සේ වචන යෙදී ඇති වරණය තෝරන්න.

(i) කොටියා, ගෝනිය, ගෞරවය, රුවල
(ii) ටොෆිය, ද්‍රෝනිය, ද්‍රුපත , රුජින
(iii) ගොරවනවා, ගෞරවය, ගුවන, කැටය
(iv) ලෝකය, කෞශල්‍ය, රුවනාර, ගැටය
(v) කොඩිය, ලෝභය, නුවන, දැල්ල (............)

1.8 මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදය ඇතුළත් පද පේළිය තෝරන්න.

| | | |
|---|---|---|
| (i) | ස්ථිර | අස්ථිර, අස්ථාවර, නොතිර, අනිත්‍ය |
| (ii) | අභිවෘද්ධිය | පරිහානිය, සමෘද්ධිය, පිරිහීම, දියුණුව |
| (iii) | සමාන | අතුල්‍ය, විෂම, අසමාන, අසදෘශ |
| (iv) | ගගන | මිහිතලය, පඨවි, වසුන්දරා , පෘථිවිය |
| (v) | උත්කෘෂ්ට | නිකෘෂ්ට, අධම, නීච, නින්දිත (............) |

1.9 මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

| | | |
|---|---|---|
| (i) | ජලය අඹ | දිය, දල , පැන් |
| (ii) | ලෝකය ජගත් | දිය, ලොව, විශ්ව |
| (iii) | රශ්මි ආලෝකය | කිරණ, මිහිර, කාන්තිය |
| (iv) | සමත දක්ෂ | සමර්ථ, සියලු, මුළු |
| (v) | වෘද්ධ මහලු | නාකි, බුඩ්ඪ, වැඩුණු (............) |

1.10 කෘදන්තයක් නොවන පදයක් ඇතුළත් වචන කාණ්ඩය තෝරන්න.

(i) කියමන්, ලියමන්, උයමන, හැඩුමන්
(ii) හැඬෙන, රැකෙන, බැලුණ, ගැයුණ
(iii) විචාර, වදාළ, කළ, වපුළ
(iv) හැඬුම්, කියනු, බලන, නැසෙන
(v) නැවුම්, කැලුම්, බැලුම්, කියුම් (............)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(i) දැහැමි, කැබැලි, මැදිරි, තොටි
(ii) මච්චත්, කුලවත්, දැන්වත්, සැපවත්
(iii) දිගටි, ඉහටි, මොළොකැටි, කරටි
(iv) සොඳුරුතම, ප්‍රියතම, අනගිතම, ශ්‍රේෂ්ඨතම
(v) නිපුණතා, දේවතා, දූර්වලතා, දක්ෂතා (............)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(i) අවමාන, අවධානය, අවබල ,අවගුණ
(ii) සුකුමාර, සුපුෂ්පිත, සුපූජිත, සුගන්ධ
(iii) නිදර්ශන, නිග්‍රහය, නික්ලේශී, නිගමනය
(iv) පරිවාර, පරිණත , පරිකල්පන, පර්යේෂණ
(v) උපකාර, උපදේශ, උපයුක්ත , උපනායක (............)

1.13 නිපාතයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(i) බොහෝ, පාසා, තව, ඉතා
(ii) පිණිස, සඳහා, නිසා, උදෙසා
(iii) මෙන් , සේ , බඳු, එච්
(iv) යළි, නිබඳ, නිතර, ඉක්බිති
(v) වනාහි , කෙරෙහි, දැනුණු ,වස් (............)

1.14 "**අත්‍යවශ්‍ය** භාණ්ඩ මිල පහත දැමීම **ජනතා** සුබසිද්ධියට **සුවිසල්** කාර්යයකි.'' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(i) කෘදන්ත , සන්ධි , නිපාත
(ii) සන්ධි , තද්ධිත , උපසර්ග
(iii) සමාස , තද්ධිත , උපසර්ග
(iv) සන්ධි, කෘදන්ත , උපසර්ග
(v) සන්ධි, සමාස , උපසර්ග (............)

1.15 අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

(i) අයෙක් , පියාණෝ ,අඟනක්, දැරියක්
(ii) සමහරුන් , දෙදෙනෙක් ,කවුරු, මිනිසෙක්
(iii) සේවිකාවක, ගුරුවරු, අයෙකු , වෙළෙන්දෝ
(iv) සිටාණන්, මවක, පුතෙක් , ඔවුන්
(v) සමහරු, ඇතැමෙක් , නාගරිකයෝ, ළමයි (............)

1.16 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?

(i) පිණිස , සෙද , වනාහි, නිකම්, සුහද
(ii) කාන්තාවනි, කුමරියනි , පුතුනි, දරුවනි
(iii) කලාතයා, උප්පිඩ ,යතුර, ලියන්නාව
(iv) ගුණැති, මැදැඟිල්ල , දකුණත , සුරිඳු
(v) නාගරික, ඉගටි, උදාරතම, ස්වදේශීය (............)

1.17 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(i) අකුසල , පාතඹර ,සෙල්පිළිම, ළදරුසිනා
(ii) අහස් දිය, අශිෂ්ට , උපදේශ , ඇළදොළ
(iii) අඹුදරු, මුංකැවුම්, මුවපියුම, අනාථාධාර
(iv) රන්කම් , රාජදඬුවම් , පෙම්බරදෑස, නැණවත්
(v) ගල්හිත , මෙහෙකරු ,සේනක පඬි, මිහිඳුම (............)

1.18 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(i) නරනිඳු, මලසුන , වමැස , පිනැති
(ii) පුළුලුර , සුවඳැති , රියදුරු, දිවැස
(iii) ගුරුතුමා, ගෙනවුත්, නළඹ, තම්පලා
(iv) වීරෝදාර, සිතුවම්, සත්කාර්ය, ග්‍රාමෝදය
(v) වක්කඩ, උග්ගස්, කම්මල , අල්ලස් (............)

1.19 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

(i) හොඳ දරුවන් මෙන් මෙයට සවන් දෙන්න.
(ii) සියලු දෙමව්පියෝ රැස්වීමට සහභාගි වේවි.
(iii) ගොවියෝ යල් කන්නයේ කුඹුරු වැඩ කරනු ඇත.
(iv) ඔවුහු අවසර දූන්හ යි ඇය සිතුවාය.
(v) හිඟන අයෙකු මහ මග වැටී සිටියේය. (............)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(i) දැන් සමහරු අකටයුතුකම් කරල ද?
(ii) ගුරුවරුන්ට අවනතව ඉගෙනීම් කළොත් යෙහෙකි.
(iii) අර දරුව ගං වතුරෙ ම නටන්නෙ.
(iv) කැලෑවෙ හීලෑ නොවූ අලි ඉන්නව ලු.
(v) වහෙන් හොරෝ බස් දෙඩුව නොවැ. (............)

(ලකුණු 20)

## II කොටස

- මෙම කොටසේ 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(2) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

ජෙසුයිට්වරුන් විසින් පූජකවරයකු යටතේ පාලනය වූ මූලික ද්විතීයික උසස් යන අංශ තුනකින් සමන්විත වූ මනාව සංවිධානය කරන ලද පාසල් පිහිටුවන ලදී. ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් මව් බසෙහි ඇති වටිනාකම ඔවුහු අවබෝධ කර ගත්හ. චාරිත්‍ර ධර්ම ඉගැන්වීමට අමතරව එම පාසල්වල මූලික අධ්‍යාපනයෙන් කියවීම, ලිවීම සහ ගායනය මව් බසින් උගන්වන ලදී. වතාවත් ඈ ආගමික කටයුතු සඳහා කාව්‍යයේ සහ සංගීතයේ ඇති වැදගත්කම ඔවුහු වටහා ගත්හ. බයිබලයේ කතාවල එන අවස්ථා උත්සව දිනයන්හි දී ළමයින් ලවා දේවස්ථානවල රඟ දක්වන ලදී. ජෙසුයිට්වරුන් දිවයිනේ අධ්‍යාපන කටයුතුවල යෙදීම නිසා අධ්‍යාපන පහසුකම්වල දියුණුවක් ඇතිවිය. මෙලෙස හැම අධ්‍යාපන ආයතනයක් ම කතෝලික පල්ලිය ආශ්‍රය කර ගෙන ඇති වූ නිසා ඒවා කෙළින් ම ආගමික බලධරයින් විසින් පාලනය කෙරුණේය.

හැම පැරිෂ් ප්‍රදේශයකම සිටි ළමයින්ට මූලික අධ්‍යාපනයක් ලබා දුන් අතර වැඩි වශයෙන් ම පෘතුගීසි සිවිල් සහ යුද්ධ නිලධරයන්ගේ ළමයින් උදෙසා ද සිංහල ප්‍රධානීන්ගේ ළමයින් උදෙසා ද ද්විතීයික අධ්‍යාපනයක් විය. ආගම ධර්මයට අමතරව කියවීම, ලිවීම මානව විෂයයන් සහ අලංකාර ශාස්ත්‍රය ද්විතියික පාසල්වල විෂය මාලාවට අයත් විය. ආගමික පොත්පත් ඉගෙනීමට සහ උසස් අධ්‍යාපනය සඳහා ලතින් භාෂාව අවශ්‍ය වූ හෙයින් යුරෝපයේ මෙන්ම මෙහි පාසල්වල ද ලතින් භාෂාව ඉගැන්වීම කෙරෙහි ද වැඩි සැලකිල්ලක් දැක්විණි. ද්විතියික අධ්‍යාපනය නිම කළ ශිෂ්‍යයන් අතුරින් පූජකවරුන් වීමට අපේක්ෂා කළවුනට පූජකවරුන් පුහුණු කරවන මධ්‍යස්ථානයකට බැඳී ආගම ධර්මය පිළිබඳව උසස් අධ්‍යාපනයක් ලබාගත හැකි විය. කෙසේ වුව ද රාජ කුමාරයන්ට ඉගැන්වීම ප්‍රැන්සිස්කන්වරුනට භාර විය. රජ කුමරකු වීසින් දත යුතු වූ අන්‍ය ශාස්ත්‍රාදියට අමතරව පෘතුගීසි , ලතින්, ඉතාලි යන භාෂා ද ඔවුනට උගන්වන ලදී.

(i) මූලික පාසල්වල උගන්වන ලද විෂයයන් මොනවාද?

(ii) උසස් අධ්‍යාපන ආයතනවල පැවති විෂය ධාරාව කෙබඳු වී ද?

(iii) ද්විතීයික අධ්‍යාපනය හා විෂය මාලාව සකස් වී තිබුණේ කවර අභිමතාර්ථ සපුරා ගැනීම උදෙසා ද?

(iv) දිවයිනේ අධ්‍යාපන පහසුකම්වල දියුණුවක් ඇතිවීම කෙරෙහි බලපෑ හේතුව වශයෙන් මෙහි දක්වා ඇත්තේ කුමක්ද?

(v) ජෙසුයිට්වරුන් විසින් පිහිටුවන ලද පාසල්වල වර්ගීකරණය සිදුවූයේ කෙබඳු ආකාරයෙන් ද?

(iv) මව් බසෙහි ඇති වටිනාකම ඔවුන් අවබෝධ කරගන්තේ කුමක් සඳහා ද?

(ලකුණු 12 යි)

(2) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියන්න. සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න. (වචන 50 60)

නැණවත් මිනිසා අධ්‍යාපනයේදී හා ධන සම්පාදනයේ දී නොදිරන, නොමැරෙන කෙනෙකුන් සේ උත්සාහවත් වෙයි. මාරයා විසින් කෙස් අගින් අල්ලා ගත්තෙකු සේ ධර්මයෙහි හැසිරෙයි. ලද දෙයින් තුටු වීම යනු උත්සාහ නොකොට සිටීම නොවේ. නිරන්තරයෙන් උත්සාහයෙන් ලබන දෙයින් තුටු වීමයි. යථාබල සන්තෝස නම් තම ශක්ති ප්‍රමාණයට අනුව තුටු වීමයි. එනම් භික්ෂුවකට යම් චීවරයක් ලැබුණු විට තමාට දරාගැනීමට බැරි තරම් ගොරෝසු නම් සුදුසු කෙනෙකුට දී, තමාට දැරිය හැකි තම ශක්තියට පහසු චීවරයක් ලබා ගැනීමයි. අපහසුවෙන්, කනගාටුවෙන් ,බලයෙන් අප කිසිවක් නොදැරිය යුතුය. දැරිය හැකි දේ දරාගෙන සිටීම සන්තෝසය දුරස් කරනු ලබයි. සම්බන්ධතා පැවැත්වීම අනවශ්‍යය. ජීවිතය නීරස කරනු ලබයි. යථා සාරුස්ස සන්තෝෂ නම් තමාට ගැළපෙන , සුදුසු ලෙසින් පමණක් තුටු වීමයි. තමාට ලැබෙන චීවරය ඉතා අනර්ඝය. ඒ චීවරය තමන්ට පරිහරණය කළ යුතු යැයි නොසිතිය යුතුය. මෙය මට වඩා උසස් අයෙකුට පරිත්‍යාග කර තමන්ට ගැළපෙන දළ සිවුරක් සොයා ගත යුතුය. එය යථා සාරුප්ප සන්තෝසයයි. (ලකුණු 13 යි)

(3) දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) තරුණ පරපුරේ ආකල්ප හා චර්යා කෙරෙහි නූතන ටෙලි නාට්‍ය ඇති කරන බලපෑම

(ii) රටක සංවර්ධන ක්‍රියාදාමයේ දී ආධ්‍යාත්මික සංවර්ධනයට ලැබිය යුතු තැන

(iii) ශ්‍රී ලංකාවේ පැරණි ජන ජීවිතය හා බැඳුණු සංස්කෘතික අගය

(iv) පරිගණක තාක්ෂණය සංවර්ධනයේ ප්‍රගමනයට යොදා ගැනීම

(v) තොරතුරු දැනුවත් කිරීමේ කාර්යයේ දී ජන මාධ්‍ය සතු වගකීම (ලකුණු 25 යි)

(4) (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ක්‍රීඩකයෝ වැඩි දෙනෙකු ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලියේදී ලෙඩ වූහ.

(ii) ගායකයන් ගීත ගයද්දී රසිකයන් උද්දාමයට පත් වූහ.

(iii) වෛද්‍යවරිය විසින් රෝගියෙක් පරීක්ෂා කරනු ලබයි.

(iv) අපි රණවිරුවනට උපහාර කළ යුතුය.

(v) සේවකයෝ සියල්ලන් ම සේවා ස්ථානයට වාර්තා කර ඇත. (ලකුණු 05 යි)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) දක්ෂ නිර්මාණකරුවෙක් රසවත් ගීතයක් රචනා කරයි.

(ii) නව විදුහල්පතිතුමා ළමයින් සඳහා ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කළේය.

(iii) ඔවුහු අප හඳුනා ගත්හ.

(iv) ගුරුවරු සිසු සිසුවියන් අගයති.

(v) ජනාධිපතිවරයා ආරක්ෂක බලධාරීන් කැඳවීය. (ලකුණු 05 යි)

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) ( ශිෂ්‍යයෝ / ශිෂ්‍යයන් ) විභාගය සමත්වෙති' යි (ගුරුවරු /ගුරුවරුන් ) බලාපොරොත්තු වූහ.

(ii) වී වගා කළ (ගොවීහු / ගොවීන් ) වගාවේ සිටි ( කෘමීන් /කෘමීහු ) පලවා හැරියහ.

(iii) ( මම / මා ) යහපත් ( පුරවැසියකු /පුරවැසියෙක්) වන්නෙමි.

(iv) (ගම්වැසියෝ/ ගම්වැසියන්) විසින් ( අපි/ අප) සාදරයෙන් පිළිගන්නා ලද්දෙමු.

(v) (ගායිකාවක / ගායිකාවක්) ගීතයක් ගයද්දී (රසිකයන් /රසිකයෝ) අත්පොළසන් ගසති.

(ලකුණු 05 යි)

(5) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායේ අනු අංගය දක්වන්න.

(i) ගුවන්යානය **බලවත්** ශබ්දයක් **නගමින්** බිමට වැටුණු බව එය **සියැසින්** දුටුවෝ කීහ.

(බලවත් - තද්ධිත, නගමින් - ක්‍රියා ,සියැසින් - සන්ධි)

(ii) **පාරම්පරික** හෙළ වෙදකමේ **කොළ මුල් පොතු** ඇසුරෙන් **සුසැදි** වටිනා බෙහෙත් වර්ග ඇත.

( **පාරම්පරික -** තද්ධිත, **කොළ මුල් පොතු - සමාස , සුසැදි - උපසර්ග**

(iii) **පුතුනි,** ඔබට මගේ සුබපැතුම් යැයි **පවසා** මව **සුරතින්** තෑග්ග පිරිනැමුවාය.

( පුතුනි - විභක්ති , පවසා - ක්‍රියා, සුරතින්-සන්ධි )

(iv) වැද්දෙකු දුටු මුවා **වහා** පැන **වනයෙහි** **තප්පරව** සැඟව ගියේය.

(වහා - නිපාත , වනයෙහි - විභක්ති , තප්පරව - සන්ධි )

(v) තම **හැකියා** වර්ධනය **වෙද්දී** ඔහු **ජනප්‍රිය** අයෙක් වේ.

( හැකියා - තද්ධිත, වෙද්දී - ක්‍රියා, ජනප්‍රිය - විභක්ති )

( ලකුණු 3 × 5= 15 යි)

(6) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) එදා මහා විහාර භූමිය සලකුණු කර ...................... ලෙස නිර්මාණ කෙරිණි.

(ii) සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ ...................... පණ්ඩිත පරම්පරාවල බුද්ධිය පෙන්නුම් කෙරේ.

(iii) නාහිමියන් පැවැත්වූ ධර්ම ...................... සඳහා මහ පිරිසක් එක් වූහ.

(iv) සීගිරිය ...................... නිමැවුම් ප්‍රකට කරන ස්ථානයයි.

(v) ගොක්කොළවලින් සැරසූ පෝරුව තුළ ......................කැටයම් දකින්නට ලැබිණි.

(vi) මහාචාර්යවරයාගේ වටිනා ...................... කාගේත් පැසසුමට ලක්විය.

(පුරාණ , සුක්ෂම , දෙසුම , සියුම් , පැරණි , දේශනය ) (ලකුණු 1/2 ×6 =3 යි)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) ගත් + ඔරුව

(ii) කාල + උචිත

(iii) හරි + ආකාර

(iv) මැද + ඇගිල්ල

(v) හේතු + උත්පත්ති

(vi) රුක් + පා

(ලකුණු 1/2 × 6 = 3 යි)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වඳුරෝ ගසින්** ගසට පැන අඹ කති.

(ii) කෘෂි සම්මේලනයේදී **ගොවීන්ට වනයෙහි** ඇති බාධා පිළිබඳ උපදෙස් ලැබිණි.

(iii) **ප්‍රදේශවාසීනි,** ඔබ **දේශපාලකයාගේ** කටයුතු ගැන සිතන්න. (ලකුණු 1/2 × 6 = 3 යි)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) මොනවා ඒ ලෙඩා මැරුණා ද

(ii) පුතේ ඉක්මනින් ගෙදර එන්න

(iii) ඇයි ඒ දරුවාට කරදර කරන්නේ ආච්චි අම්මා විමසුවාය

(ලකුණු 1/2 × 6 = 3 යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) මම ඔබගේ බසට ඇහුම්කන් දෙමි'යි අම්මා ප්‍රකාශ කළාය.

(ii) මම මගේ කාර්යය ඉටු කරමි. ඔබ ඔබේ ක්‍රියාවන් සිදුකරන්නැ'යි ගුරුතුමිය පැවසුවාය.

(iii) අපි වැරදිකරුවන් අත් අඩංගුවට ගන්නවා'යි පොලිස් නිලධාරීහු අවධාරණය කළහ.

(ලකුණු 1/2 × 6 = 3 යි)

(7) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බුදු සමය විරාගී **දර්ශනයකි.** චරණයකි. මුනිඳු දෙසූහ. සදාකාලික සතුට ලැබුවෝ මෙම විරාගී චරණයෙන් යුක්ත වූවෝය. නොඇලුණෝය. සියල්ලෙහි සත්‍ය දැන දැන පසක් කර එය දැන ගත්තෝය. ජීවිතයෙහි අප්‍රිය දේ මෙන්ම ප්‍රිය දේ ද තාවකාලික බව කරුමයේ අවසන දුක බව දත්තෝය. ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා , සැප, දුක චක්‍රයක් මෙන් **එළඹෙන** බව අවබෝධ කොට ගත්තෝය. සියල්ල අනිත්‍ය , **දුක්ඛ,** අනාත්ම බව පසක් කොට ගත්තෝය. කිසිවක නොඇලීම ම සදාකාලික සුවය සදන බව දත්තෝය. මෙලෙස අටලෝ දහමෙහි කම්පා නොවීම මංගල කරුණකි. එය අවබෝධ කර ගත් තැනැත්තා සිවු දිගින් හමා එන සැඩ **සුළඟින්** නොසැලෙන ස්තම්භයක් සේ සියල්ල ඉත සිතින් පිළිගත්තේය. මෙලෙස බුදු **දහමෙහි** සිතැති **සියල්ල** උගන්වන ස්ථාවර අකම්ප්‍ය ලක්ෂණ දැකිය හැක. එවැනි තැනැත්තා මංමුළා නොවී සතුට භුක්ති විඳිමින් වසයි.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) කරුමයේ, ජීවිතයෙහි , ප්‍රශංසා යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1 රකාරාංශයක් සමග තාලුජ අක්ෂරයක් සහිත වචනයක්

2 යංශය සහිත වචනයක්

3 අන්තඃස්ථාක්ෂර දෙකක් සහිත වචනයක්

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

මුනිඳු , සිතැති , මංමුළා

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න,

පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා ,අතීත ඒකවචන අවසාන ක්‍රියාවක් (ලකුණු 3 × 5 = 15 යි)

(8) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න,

(i) ඌෂ්මාක්ෂර

(ii) ද්විත්වරූප සන්ධිය

(iii) මිශ්‍ර ක්‍රියා

(iv) ක්‍රියා විශේෂණ

(v) අල්පප්‍රාණ අක්ෂර (ලකුණු 5 × 3 = 15 යි)

* * *

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය**

**දෙවන වාර පරීක්ෂණය 2020 මාර්තු**

# සිංහල

**12 ශ්‍රේණිය**

# Sinhala

## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

(1) (අ) I මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාගේ රථ මැදිරියට සුදුසු රෝද දෙකක් ලැබුණොත් ජීවත් වන බවත් නොලදොත් මැරෙන බවත් ප්‍රකාශ කිරීම.

II තම පුතුගේ අසනීපයට බෙහෙත් කිරීමේ දී හා කුණ්ඩලාභරණය තැනීමේදී මසුරු වූ අදින්නපුබ්බක සත් රුවනින් කරත්ත රෝද දෙකක් සාදා දීමට පොරොන්දුවීම.

III ජලය වත්කළ යුතු ගසට උණු ජලය වත්කරනවා වාගේ බෙහෙත් නොවූ දේවල් බෙහෙත් ලෙස බොන්න දීමෙන් මැරු බව.

IV අමිශ්‍ර වූ රත්තරන්වලින් කරන ලද, ගන රන් යනු තනි රත්තරන් ය මුවා යනු එයින් කරන ලද යන අරුත් දෙයි.

(ආ) I මරණයට පෙර ජරාවට පත් විය හැකි, ජරාවට පත්වීමට පෙර එනම් තරුණ වයසේ දී ම මරණයට පත් විය හැකි බව.

II හුදකලාව කැලයට ගොස් තපස් රැකීම ඒකාන්ත සැප විඳීමකි.

III නිර්වාණගාමී වූ අය අපේ ඉසෙහි (ඔළුවෙහි) ඔවුන්ගේ පයෙහි ඇති දූවිලි දමාගෙන ආකාශයෙන් ගමන් ගන්නා බව.

IV පංචකාම වස්තූන්ගෙන් ලබන සැපය කාම සුවය යනු රූප, ශබ්ද ,ගන්ධ ,රස ස්පර්ශ යන පංචකාම වස්තූන්හි ඇලීමෙන් ලබන සැපය යි.

(ඉ) I බුදුන් වහන්සේ කෙරෙහි සිත පහදා ගැනීම නිසා.

II මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා තමාගේ දිව්‍ය සැපතින් පිරුණු මාළිගාව සමග මෙම ස්ථානයට පැමිණෙත් වා යි අධිෂ්ඨාන කිරීම.

III සාක්ෂියක් ලබාගන්නව වගේ මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා ලබාගත් සම්පත් පෙන්වා සැකය නැති කිරීම.

IV සාක්ෂි කී අයට යමක් ඔප්පු කිරීමට කරුණු දැක්වීම කිවුවන්ට යනු කී අයට යන්නයි.

(ඊ) I එක් කොටසක් බීජ සඳහා ද අනෙක් කොටස ආහාර වශයෙන් කෑම සඳහා ය. බිජුවට කොටස නැවත වැපිරීමට යි. ඇස්භාගය ආහාරය සඳහා තබා ගත යුතුය.

II මෙසේ දිවි හිමියෙන් ම යලත් මාසත් අප්‍රමාද ව මෙහෙ කළ මැනව.

III අත් දෙකට ලී දෙකක් හෝ හැරමිටි දෙකක් රැගෙන ඇඟ රැළි වැටීම් හා ඉස කෙස් පැසී දෙකට නැමී ගෙන හෙවත් කුදු ගැසී

IV බීජ සඳහා පැළ නොකළ හැකි වී කොටස පැළ නොවන වී කොටස ඇස් නම් වේ.

(උ) I කෙළි සෙල්ලම් කරමින් , ගුරුවරුන්ගේ ආදරයට ලක් වෙමින් පිං පිඩක් වගේ සොමනසින් ළමාකාලය ගත විය.

II ''ගුරුන් පෙමකොඳ තරි + ඳුව''

III ගුත්තිල තරුණයා දිව්‍යාංගනාවන් උවත් තමා වෙතට ඇද ගන්නා තරම් රූපශ්‍රීයෙන් යුක්තයි.

IV නිර් අංග - අංග නැත්තේ යනු නරඟ ය. එනම් අනංගයා ය. නරඟ යනු අනංගයාගේ රූප විලාසය ගත් බවයි.

(ඉ) I දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවෙන් උපුටා ගන්නා ලදී. මට්ටකුණ්ඩලීගේ රෝගය අසාධ්‍ය වී ඔහු මරණාසන්න අවස්ථාවේ ඔහුව පිළට දමන මොහොතේ අදින්න පුබ්බක බමුණා සිතන සිතිවිල්ලකි.

II දඹදෙණි යුගයේ මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලිය කෘතියේ අනුරුද්ධ කුමාර කතාවෙන් උපුටා ගන්නා ලදී. දිව්‍ය කැවුම් කා සතුටට පත් වූ අනුරුද්ධ කුමාරයා ඒ රසයෙන් සතුටු වී මවගේ උකුලේ වාඩි වී දැතින් ඇයව තරව පැළඳගෙන මෙසේ අසයි.

III දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවෙන් උපුටා ගන්නා ලදී. මරණාසන්න මොහොතේ පිළේ සිටි මට්ටකුණ්ඩලී ට පෙනෙන ලෙස වැඩි බුදුන් වහන්සේ අසාධ්‍ය මට්ටකුණ්ඩලී තමන් කෙරෙහි සිත පැහැදුණ බව දැන මෙසේ සිතයි. (මට්ටකුණ්ඩලීට බුදුන් වැදීමට අත පය සෙලවිය නොහැකි බැවින්)

IV ලෙනාර්ඩ් වුල්ෆ් විසින් රචනා කරන ලද ඒ .පී. ගුණරත්න මහත්මා විසින් සිංහලයට අනුවර්තනය කරන ලද බැද්දේගම නවකතාවෙන් උපුටා ගන්නා ලදී. පුංචි මැණිකා බබුන් සොයා ගෙන හිර ගෙදරට ගිය අවස්ථාවේ එහි සිටි මහල්ලාට පුංචි මැණිකා විසින් කරන ලද ප්‍රකාශයයි.

V මාර්ටින් වික්‍රමසිංහ සූරින් විසින් රචනා කරන ලද වහල්ලු කෙටිකතා සංග්‍රහයේ වහල්ලු කෙටිකතාවෙන් උපුටා ගන්නා ලදී. ගමෙහි මැදි වියෙහි ගැමියෙකු උපාලිස්ගේ හඳයාව ගෙනයාමට සූදානම් වූ අවස්ථාවේ උපාලිස්ගේ දියණිය 'එපා' යයි කියූ නිසා ඇයට මෙසේ ප්‍රකාශ කරන ලදී.

IV මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙන් උපුටා ගන්නා ලදී. තක්සලාවේ හුදකලාව සිටි උද්දාල බමුණා චණ්ඩාල බමුණාව හා ස්වර්ණතිලකාව දුටු අවස්ථාවේ උද්දාල බමුණා සිතේ ඇතිවූ කැළඹීම ගැන ශිෂ්‍යයන්ට ප්‍රකාශ කළ අවස්ථාවේ ශිෂ්‍යයන් හැමදෙනා විසින් උද්දාල බමුණාට මෙසේ ප්‍රකාශ කරන ලදී.

VII දඹදෙණි යුගයේ මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍රහිමියන් විසින් රචිත පූජාවලියෙහි අනුරුද්ධ කුමාර කතාවෙන් උපුටා ගන්නා ලදී. අනුරුද්ධ කුමාරයා නැතැයි යන බසෙහි අර්ථය නොදැන නැති පූ ඉල්ලා පණිවිඩ එවන අවස්ථාවේ කුමාරයාගේ මැණියන් විසින් මෙසේ සිතන ලදී.

**ලකුණු ප්‍රදානය කිරීම**

| | | |
|---|---|---|
| පොත හා කර්තෘවරයාට | - | ලකුණු 01 |
| කවුරුන් විසින් කාහට | | ලකුණු 01 |
| අවස්ථාවට | | ලකුණු 01 |

(රසාස්වාදයට ලකුණු ප්‍රදානයේ දී පද්‍ය පන්තිය සමස්තයක් ලෙස ගෙන භාෂා ලක්ෂණ ආදිය ගැන ලියා ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. කවිය ලියා තේරුම ලියා ඇත්නම් ප්‍රදානය කළ හැකි උපරිම ලකුණ 6 කට අඩු බව සලකන්න.)

# සිංහල II I කොටස

| | | | |
|---|---|---|---|
| 1.1 - III | 1.6 - III | 1.11 - II | 1.16 - I |
| 1.2 - II | 1.7 - III | 1.12 - IV | 1.17 - IV |
| 1.3 - IV | 1.8 - II | 1.13 - V | 1.18 - I |
| 1.4 - II | 1.9 - III | 1.14 - II | 1.19 - I |
| 1.5 - IV | 1.10 - V | 1.15 - III | 1.20 - II |

( ලකුණු 20 යි)

# II කොටස

(2) (අ) (I) මවුබස , කාව්‍ය , සංගීතය

(II) මුලින් ආගම ධර්මය ඉගෙන ගත යුතුවීම අමතරව පෘතුගීසි, ලතින්, ඉතාලි භාෂා ඉගැන්වීම සිදුවීය.

(III) පෘතුගීසි, සිවිල් සහ යුද්ධ නිලධාරින්ගේ ළමයින්ට සිංහල ප්‍රධානීන්ගේ ළමයින් උදෙසා අධ්‍යාපනය දීම.

(IV) ආගමික පොත්පත් ඉගෙනීමට හා උසස් අධ්‍යාපනය සඳහා ලතින් භාෂාව අවශ්‍යවීම.

(V) මූලික ද්විතීයික හා උසස් යන ආකාරයෙන්

(VI) ඉගැන්වීමේ මාධ්‍ය වශයෙනි (ලකුණු 2×6 = 12යි)

(ආ) සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට ලකුණු 2 යි
අක්ෂර වින්‍යාසයට ලකුණු 3 යි
අන්තර්ගතයට ලකුණු 8 යි
(සාරාංශයට මුළු ලකුණු 13 යි)

(3) රචනය - ලකුණු දීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරිම සුදුසුය

(I) රචනය සඳහා තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
(II) එම කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරිම
(III) කරුණුවල පැහැදිළි බව
(IV) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කිරිම
(V) ව්‍යාකරණ දොෂ රහිත වීම
(VI) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
(VII) සුදුසු ලෙස පද බෙදීම හා ඡෙද වෙන් කිරිම
(VIII) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිළිවීම (ලකුණු 25 යි)

(4) (අ) (I) ක්‍රීඩකයෝ වැඩි දෙනෙක් ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලියේදී ලෙඩ වූහ.
(II) ගායකයන් ගීත ගයද්දී රසිකයෝ උද්දාමයට පත්වූහ.
(III) නිවැරදි වාක්‍යයකි.
(IV) අප රණවිරුවනට උපහාර කළ යුතුය.
(V) සේවකයන් සියල්ලන් ම සේවා ස්ථානයට වාර්තා කර ඇත . (ලකුණු 5 යි)

(ආ) (I) දක්ෂ නිර්මාණකරුවෙකු විසින් රසවත් ගීතයක් ගායනා කරනු ලබයි/ලැබේ.
(II) නව විදුහල්පතිතුමා විසින් ළමයින් උදෙසා ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කරනු ලැබීය/ලැබුවේය /ලදී/ලද්දේය/ලැබිණි/කරන ලද්දේය.
(III) ඔවුන් විසින් අපි හඳුනා ගන්නා ලද්දෙමු/ලැබුවෙමි/ලැබීමු.
(IV) ගුරුවරුන් විසින් සිසු සිසුවියෝ අගය කරනු ලබති/කෙරෙති/කෙරෙත්
(V) ජනාධිපතිවරයා විසින් ආරක්ෂක බලධාරිහු කැඳවනු ලැබුහ/ ලදහ. (ලකුණු 5 යි)

(ඉ) (I) ශිෂ්‍යයන් - ගුරුවරු (II) ගොවීහු - කෘෂීන්
(III) මම - පුරවැසියෙක් (IV) ගම්වැසියන් - අපි
(V) ගායිකාවක - රසිකයෝ (ලකුණු 5 යි)

(5)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| (I ) බලවත් | තද්ධිත | 'ඇත' යන අර්ථයෙහි අස්ත්‍යාර්ථයෙහි |
| නගමින් | ක්‍රියා | මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය |
| සියැසින් | සන්ධි | පූර්වස්වර ලෝප සන්ධිය |
| | | |
| (II ) පාරම්පරික | තද්ධිත | පරම්පරාවට අයත් යන අර්ථයෙන් /ජාතාර්ථය |
| කොළ මුල් පොතු | සමාස | ද්කාරාර්ථ සමාසය |
| සුසැදි | උපසර්ග | වඩා යන අර්ථය අධික යන අර්ථය භූෂණාර්ථය මහා යන අර්ථය |

| | | |
|---|---|---|
| (III ) පුතුනි | විභක්ති | ආලපන විභක්තිය |
| පවසා<br>සුරතින් | ක්‍රියා<br>සන්ධි | පූර්ව ක්‍රියා<br>පූර්වස්වර ලෝප සන්ධිය |
| | | |
| (IV) වහා | නිපාත | ශීඝ්‍රාර්ථයේ |
| වනයෙහි | විභක්ති | ආධාර විභක්තිය |
| තප්පරව | සන්ධි | පරරූප සන්ධිය |
| | | |
| (V) හැකියා | තද්ධිත | (ආ ප්‍රත්‍ය) බව යන අර්ථයේ |
| වෙද්දී | ක්‍රියා | කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා |
| ජනප්‍රිය | විභක්ති | සම්ප්‍රදාන විභක්ති |

(ලකුණු 3 × 5 = 15)

6) (අ) (I) සූක්ෂ්ම (II) පුරාණ
(III) දේශනය (IV) පැරණි
(V) සියුම් (VI) දෙසුම (ලකුණු 1/2 × 6 = 3 යි)

(ආ) (I) ගන්නොරුව (II) කාලෝචිත
(III) හරියාකාර (IV) අග්ගිසි
(V) හේතුත්පත්ති (VI) රුප්පා (ලකුණු 1/2 × 6 = 3 යි)

(ඉ) (I) වඳුරෝ - ප්‍රථම විභක්ති (II) ගොවීන්ට - සම්ප්‍රදාන විභක්ති
ගසින් - අවධි විභක්ති වනයෙහි - ආධාර විභක්ති

(III) ප්‍රදේශවාසීනි - ආලපන විභක්ති
දේශපාලකයාගේ - සම්බන්ධ විභක්ති (ලකුණු 1/2 × 6 = 3 යි)

(ඊ) (I) මොනවා ! ඒ ලෙඩා මැරුණා ද?
(II) පුතේ, ඉක්මනින් ගෙදර එන්න.
(III) ''ඇයි ඒ දරුවාට කරදර කරන්නේ'' ආච්චි අම්මා විමසුවාය. (ලකුණු 1/2 × 6 = 3 යි)

(උ)(I) ඇය මගේ බසට ඇහුම්කන් දෙන බව අම්මා ප්‍රකාශ කළාය.
(II) ඇය ඇගේ කාර්යය ඉටු කරන බවත් මට මගේ ක්‍රියාවන් සිදු කරන්න ගුරුතුමිය පැවසුවාය.
(III) ඔවුන් වැරදිකරුවන් අත්අඩංගුවට ගන්නා බව පොලිස් නිලධාරිහු අවධාරණය කළහ. (ලකුණු 1 × 3 = 3 යි)

(7) (I) එළඹෙන , දර්ශනය , දහමෙහි , දුක්ඛ, සියල්ල , සුළඟින්
(II) කරුමයේ - කෙටි පාපිල්ල, කොම්බුව , හල් කිරීම
ජීවිතයෙහි - දීර්ඝ ඉස්පිල්ල, ඉස්පිල්ල ,කොම්බුව, ඉස්පිල්ල
ප්‍රශංසා- රකාරාංශය, ඇලපිල්ල

(III) 1 ප්‍රශංසා
2 සත්‍ය / අනිත්‍ය / අකම්පස
3 පරිවර්තනය/ ස්ථාවර /තාවකාලික

(I ) මුනිඳු - මුනි + ඉඳු - පූර්වස්වර ලෝප සන්ධිය
සිතැති - සිත් + ඇති - ස්වර සන්ධිය
මංමුළා - මඟ + මුළා - ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය

(II) පසක් කර - පූර්ව ක්‍රියා
විඳිමින් - මිශ්‍ර ක්‍රියා
පිළිගත්තේය - අතීත ඒකවචන අවසාන ක්‍රියාව (ලකුණු 3 ×5 = 15 යි)

(8) මෙහි හැඳින්වීමට ලකුණු 3 යි
උදාහරණවලට ලකුණු 2 යි
බැගින් ලකුණු පිරිනමන්න (ලකුණු 5 ×3 = 15 යි)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers
• Model Papers
• Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440